**රත්මලාන / මොරටුව සහ ජාඇල/ ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතිය- 2015**

---------------------------------------------------------------------------------------------

රත්මලාන / මොරටුව සහ ජාඇල/ ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රජය හා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය (SIDCA) අතර 2006 මාර්තු 02 දින එළඹි අංක 71001436 දරන නිශ්චිත ගිවිසුමේ 11 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ නිශ්චිත ගිවිසුම අනුව, එවකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ මධ්‍යම පිරිසිදු කිරීමේ පිරියතයන්ට කර්මාන්ත හා ගෘහස්ථ අප ජලය සුදුසු පරිදි එකතු කිරීමක සහිතව පරිසරයට හෝ ජනතාවට හානිකර නොවන ආකාරයකින් පාවිච්චි කරන ලද අප ජලය හා ඝන මඩ ජලය අපහරණය කිරීම සමඟ රත්මලාන/ මොරටුව හා ජාඇල/ ඒකල යන ප්‍රදේශ දෙකෙහි පරිසර දූෂණය කළමනාකරණය කිරීම තහවුරු කර ගැනීමයි. ව්‍යාපෘතියේ දිගුකාලීන සමස්ත අරමුණු වන්නේ ප්‍රදේශයේ ජනතාව සඳහා සෞඛ්‍ය හා ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම, සංවේදී ජෛව පද්ධතිවල පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා දායකවීම සහ රත්මලාන/ මොරටුව හා ජාඇල / ඒකල ප්‍රදේශවල මලාපවහන ජාලයන් හා පිරිසිදු කිරීමේ පහසුකම් සැපයීම මඟින් කොළඹ අවට කර්මාන්ත ප්‍රදේශවල තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමයි. නිශ්චිත ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,135 කට සමාන එජඩො මිලියන 120.02 ක් වන අතර රු.මිලියන 9,058 කට සමාන එජඩො මිලියන 91.92 ක් ණයක් වශයෙන් හා රු.මිලියන 474 කට සමාන එජඩො මිලියන 4.14 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය එකඟවී තිබුණි. පසුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 17,471 කට සමාන එජඩො මිලියන 148.91 දක්වා සංශෝධනය කර තිබූ අතර ඉන් රු.මිලියන 11,315 කට සමාන එජඩො මිලියන 95.06 ක් ණයක් වශයෙන් හා රු.මිලියන 1,034 කට සමාන එජඩො මිලියන 8.99 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2013 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2016 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන්

තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය සහ ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) නිශ්චිත ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) නිශ්චිත ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතුව රු.මිලියන 1,440.30 ක් වූ එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට රජයේ දායකයෙන් ලත් මුදල් වලට එරෙහිව හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රජයේ දායකය හා කෙරී ගෙන යන වැඩ එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත් රු.මිලියන 1.17 ක ප්‍රමාණ කළ අලාභ, කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ වලින් අඩුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කළ වැඩ වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් ණය නියෝජිතායතනයට සෘජුවම ගෙවන ලද එකතුව රු.මිලියන 71.8 ක් වූ බැඳීම් ගාස්තු, කළමනාකරණ හා පරිපාලන ගාස්තු ආදිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදෙන ලද ස්ථාවර වත්කම් පිළිබඳ අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් ලෙජර ගිණුම්වල කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.මිලියන 114.21 ක් වූ සිවිල්කර්ම ගොඩනැගිලි හා එකතුව

රු.මිලියන 214.14 ක් වූ වෙනත් වත්කම්වල වටිනාකම්, ස්ථාවර වත්කම් ලේඛනයේ හා භෞතික සත්‍යාපන වාර්තා වල දැක්වෙන පිළිවෙලින් රු.මිලියන 44.35 ක් හා රු.මිලියන 15.68 ක් වූ අනුරූපී වටිනාකම් සමඟ ගැලපී නොතිබුණි

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වගන්තිය අනුව, රු.මිලියන 5 කට වැඩි වටිනාකම් ඉක්මවන කොන්ත්‍රාත් භාර ගන්නා කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර් වෙත ලියාපදිංචි විය යුතුය. තවද කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ගිවිසුම ලියාපදිංචි කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු කරන කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු විසින් ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟවූ මුදල | | | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භක වෙන්කිරීම | | සංශෝධිත වෙන්කිරීම | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායනය | | | | | | | | | |
| - ණය | 91.92 | 9,058 | 95.06 | 11,315 | 694.00 | 4.59 | 633.95 | 90.28 | 10,468.83 |
| - ප්‍රදාන | 4.14 | 474 | 8.99 | 1,034 | 57.00 | 0.07 | 8.31 | 8.07 | 969.12 |
| ශ්‍රීලංර | 23.96 | 2,603 | 44.86 | 5,122 | 315.25 | 1.29 | 175.77 | 28.73 | 3,749.62 |
| එකතුව | 120.02 | 12,135 | 148.91 | 17,471 | 1,066.25 | 5.95 | 818.03 | 127.08 | 15,187.57 |

### 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, ජාඇල/ඒකල අප ජලය පවිත්‍ර කිරීමේ පිරියත හා නළ එලීමේ කාර්යයන් 2012 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. මොරටුව / රත්මලාන අප ජලය පවිත්‍ර කිරීමේ පිරියත හා නළ එළීමේ කාර්යයන් 2015 දෙසැම්බර් 31 දිනට සියයට 94.18 ක ප්‍රගතියක් දක්වා තිබුණි. තවද මොරටුව හා රත්මලාන ප්‍රදේශවල කර්මාන්ත ස්ථානයන් 253 කට හා නිවැසියන් 25,000 කට මලාපවහන පද්ධති පහසුකම් සැපයීමට ව්‍යාපෘතිය විසින් ඉලක්ක කර තිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ස්ථාන 121 කට හා නිවැසියන් 15,228 කට පමණක් සම්බන්ධතාවයන් සපයා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී ප්‍රදානය කරන ලද රත්මලාන / මොරටුව ප්‍රදේශයේ අප ජලය අපහරණ පද්ධතිය පිළිබඳ කොන්ත්‍රාත්තුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල පරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු බුන්වත්වීම හේතුකොට ගෙන ව්‍යාපෘතිය විසින් 2013 වර්ෂයේදී අවසන් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 3.55 ක් වූ නෛතික ගාස්තු දරා තිබුණද, එජඩො මිලියන 9.06 ක් වූ කාර්ය සාධන බැඳුම්කරය හා එජඩො මිලියන 7.96 ක් වූ ඇපකර විදේශ වානිජ බැංකුවකින් මුදල් කර ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. තවද කොන්ත්‍රාත්කරුට ගෙවන ලද වැඩිපුර ගෙවීම් එජඩො මිලියන 6.74 ක් අයකර ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් දේපල වලට කරන ලද හානි මත රු.මිලියන 18.39 ක මුදලක් තුන්වන පාර්ශවයන් විසින් ව්‍යාපෘතියෙන් ඉල්ලීම් කර තිබුණු බවද තවදුරටත් නිරික්ෂණය විය.

(ආ) පළමු කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු වීමෙන් පසුව, නළ එළීම් වැඩ කිහිපයක් හැර , රත්මලාන/ මොරටුව අප ජලය අපහරණ පද්ධතිය පිළිබඳ නව කොන්ත්‍රාත්තුවක් වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. තවද පළමු කොන්ත්‍රාත්කරු විසින් නිම නොකරන ලද සැලසුම් ඇඳීම් සහ හානි වූ වාතාශ්‍ර නළ (Ventilation Pipes ) යළි සවි කිරීම නව කොන්ත්‍රාත්කරු විසින් 2015 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී රු.මිලියන 7.37 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ප්‍රදානය කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම වැඩපොළ හා පුහුණු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර මලාපවහන ජාලය සැපයීම හා එළිම පිළිබඳ කොන්ත්‍රාත්තුව සහ රත්මලාන පිහිටි පොදු මලාපවහන ජාලයේ අන්තර් ප්‍රතිග්‍රාහක මනු බිල (Interceptor Manhole ) සඳහා සම්බන්ධතාවයන් සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 1.3 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් මුදාහැර තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) නිශ්චිත ගිවිසුමේ 1 ව්‍යවස්ථාව ප්‍රකාරව, පාවිච්චි කරන ලද ජලය හා මඩ ජලය ජාඇල / ඒකල ප්‍රදේශවල පරිසරයට හා ජීවත්වන ජනතාවට හානිදායක නොවන ආකාරයකින් අපහරණය කිරීම අවශ්‍ය විය. කෙසේ වුවද, ජාඇල / ඒකල අප ජලය පාලන පිරිසිදු කිරීම් පිරියත යටතේ එවැනි යාන්ත්‍රණයක් 2016 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.4 පරිබාහිර ගනුදෙනු

--------------------

ව්‍යාපෘතියේ අරමුණුවලට ඍජුවම අදාළ නොවන මාදිවෙල ලින්ක් නිවාස ක්‍රමය සඳහා අප ජලය පවිත්‍ර කිරීම හා අපහරණ පද්ධතිය වෙනුවෙන් සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්ට සොයිසාපුර නිල නිවාස ඉදිකිරීම හා නිම කිරිම සඳහා සැලසුම් හා ගොඩනැඟිලි කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 69.1 ක මුදලක් වැය කර තිබුණි.

### 3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට නිම කරන ලද මාර්ග ප්‍රතිකර්ම වැඩ සඳහා 2012 හා 2013 වර්ෂයන්හිදී මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්පත් කරන ලද එකතුව රු.මිලියන 12.98 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 05 ක් පිළිබඳව මාගේ පෙර වර්ෂයේ වාර්තාවෙන් පෙන්වා දී තිබුණද, 2016 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සහ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විගණන අංශය විසින් විගණනයට භාජනය කර නොතිබුණි.

### 3.6 මතභේදයට තුඩුදෙන කරුණු

------------------------------

ව්‍යාපෘතිය විසින් පරිපාලන කාර්යයන් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණද, පරිවයක් වශයෙන් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකර තිබූ අතර ඒ සඳහා සියයට 20 ක පොදු කාර්ය පිරිවැය ව්‍යාපෘතියෙන් අයකර ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට එසේ ගෙවන ලද පොදු කාර්ය පිරිවැය රු.මිලියන 253.27 ක් විය.